# විද්‍යාර්ථීන් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමේදී උච්චාරණයේ ඇති ගැටලු පිළිබඳ විමර්ශනයක්
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

එස්.සී. ලසන්ති[1]

**සංක්ෂේපය**

විද්‍යාර්ථීන්, ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ දී එය භාවිතයේ දී මුහුණපාන ගැටලුවක් වන උච්චාරණයේ ඇති අපහසුතාවය පිළිබඳව කැලණිය විශ්වවිද්‍යාලයී සිසුන් 100ක් ඇසුරින් ලබාගත් සසම්භාවී නියැදියක් මඟින් මෙම අධ්‍යයනය කරන ලදි. මේ සඳහා බලපාන්නේ කිනම් සාධකයන් ද යන්න සොයා බැලීම මෙහි මූලික පරමාර්ථය වූ අතර සෙසු අරමුණ වූයේ ඉංග්‍රීසි භාෂාව භාවිතයට විශ්වවිද්‍යාලය ගෙන ඇති පියවරවල ක්‍රමවත්භාවය විමර්ශනය කිරීමයි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත යොදාගත් අතර ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් දත්ත රැස් කරන ලදී. පරීක්ෂණයේ දී ලැබූ දත්ත ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රම මඟින් විශ්ලේෂණය කල අතර එහිදී සමාජීය විද්‍යා, මානව ශාස්ත්‍ර පීඨවල විද්‍යාර්ථීන්ගෙන් 35% ක පමණ ප්‍රමාණයක් ද විද්‍යා, වාණිජ හා කළමනාකරණ පීඨ විද්‍යාර්ථීන් එම සිසුන්ට වඩා යහපත් මට්ටමක් පෙන්වමින් ඔවුන්ගෙන් 20% ක පමණ ප්‍රමාණයක් ද උච්චාරණයේ අපහසුතාවයෙන් යුතු පිරිසක් බව හෙළිවිය. මේ සඳහා බලපෑ හේතු පිරික්සීමේ දී විද්‍යාර්ථීන්, ප්‍රථම වසර තුළ ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීම අනිවාර්යය කොට තිබුණ ද ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම ඔවුන්ගේ මූලික පරමාර්ථය නොවන අතර උපාධිය සම්පූර්ණ කිරීමට මෙය අමතර සුදුසුකමක් හෙයින් එම නිසා දේශනවලට සහභාගී වන බවත් හෙළි විය. එසේම දේශන කිහිපයක් ඉංග්‍රීසියෙන් පැවැත්වුව ද ඉන් මෙම භාෂා උච්චාරණ හැකියාවට පිටිවහලක් නොවන බව පැහැදිලි විය. අධ්‍යයනයේ සොයාගැනීම් වලට අනුව ඉංග්‍රීසි භාෂා උච්චාරණ අපහසුතාවයට මූලිකම හේතුව භාෂාවේ ප්‍රායෝගිකත්වය හෙවත් නිතර නිතර භාවිතයක් නොමැතිකම මෙන්ම එම පහසුකම් නිසිලෙස ප්‍රයෝජනයට නොගැනීම බව හෙළි විය. එමෙන්ම භාෂා හැකියාව සිසුන් තුළ ප්‍රගුණ කිරීම උදෙසා විශ්වවිද්‍යාලය මඟින් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් හි ක්‍රමවත්භාවයේ පවතින අඩුපාඩු දැකගත පවත්නා බැව් තහවුරු විය. මෙම දුර්වලතා මග හරවා ගැනීමට ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම අවුරුදු 3 හා 4 ඇතුළත අනිවාර්ය කිරීමත් දේශන මාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීමත් ඒ සඳහා ඇති පහසුකම් තවත් පුළුල් කිරීමට විශ්වවිද්‍යාලය ගෙන ඇති පියවර තවත් ක්‍රමවත් කිරීමත් ආදිය යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.

**මුඛ්‍ය පද** : *ඉංග්‍රීසි භාෂාව, විද්‍යාර්ථියා, උච්චාරණය, විශ්වවිද්‍යාලය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
chathusenevirathne93@gmail.com